# කම්කරු දෙපාර්තමේන්තුව

## කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02 සේවා ගණයේ ලඝු ලේඛක තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 මාර්තු

ඉහත තනතුර සඳහා වන 2013.04.11 දිනැති කම්කරු දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02 සේවා ගණයේ ලඝු ලේඛක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුව එම සේවයේ **III** ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022 මාර්තු මාසයේ දී කම්කරු දෙපාර්තමේන්තුවේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම පරීක්ෂණය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකි.

### 01. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය | කාලය |
|---|---|---|
| කාර්යාල ක්‍රම හා ගිණුම් ක්‍රම | 1. රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව.<br>2. රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යය පිළිබඳ අවබෝධය | පැය 02 |

අවම ලකුණු 40%ක් ලබාගත් අපේක්ෂකයන් එම විෂයය සමත් ලෙස සැලකේ

### 02. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

මෙම පරීක්ෂණ සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂයන් මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4 කඩදාසියක දෙපැත්තම පාවිච්චි කරමින් අංක 01 සිට 05 දක්වා ඡේද එක් පිටුවකටත්, ඉතිරි කොටස අනෙක් පිටුවටත් වන සේ සකසා ගත් අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **2022 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම** කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව, 8 වන මහල, "මෙහෙවර පියස", නාරාහේන්පිට, කොළඹ 05 ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **"ලඝු ලේඛක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 මාර්තු"** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03.** මෙම පරීක්ෂණයට පළමුවරට ඉල්ලුම් කරන අපේක්ෂකයින්ගෙන් හැර අනෙකුත් සියළුම අපේක්ෂකයින් විභාග ගාස්තු ලෙස රුපියල් 300/- ක මුදලක් අය කරනු ලැබේ.

**04. විභාග ගාස්තු ගෙවීම :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර මෙම විභාග ගාස්තු කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත හෝ කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල/උප කාර්යාලවල මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් ලදුපත ඉල්ලුම්පත්‍රයේ අදාළ කොටසේ අලවා එවිය යුතුය.

**සැ.යු.** **<u>ප්‍රධාන කාර්යාලයට විභාග ගාස්තු ගෙවනු ලබන අපේක්ෂකයින්</u> - ලදුපත ලබා ගැනීමේදී සම්පූර්ණ කළයුතු පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය 2003.02.99 ලෙසද,**

**<u>ප්‍රාදේශීය/උප කාර්යාලවලට විභාග ගාස්තු ගෙවනු ලබන අපේක්ෂකයින්</u> - ලදුපත ලබා ගැනීමේදී සම්පූර්ණ කළ යුතු පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය 2003.02.99 ලෙසද සඳහන් කරන්න.**

**(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

| |
|---|
| සටහන : විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය. |

**05. විභාගයට පෙනී සිටීමට සුදුසුකම් :**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**06. පරීක්ෂණය පැවැත්වීම :**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කාල සටහන නිකුත් කරනු ලැබේ.

**07.** විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම්, සංයුක්ත දීමනා හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

එච්.ටී.පී. අබයරත්න
කම්කරු කොමසාරිස් (පාලන)
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

එච්.ටී.පී. අබයරත්න
කම්කරු කොමසාරිස් (පාලන)

අත්/කළේ: බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

දිනය: 2022.02.10

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**කම්කරු දෙපාර්තමේන්තුව**

**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 02 සේවා ගණයේ ලසු ලේඛක තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 මාර්තු**

01. 1.1 අයදුම්කරුගේ මුලකරු සමග නම : (සිංහලෙන්) . ........................................
..............................................................................................................................

1.2 අයදුම්කරුගේ මුලකරු සමග නම : (ඉංග්‍රීසියෙන්).........................................................
..............................................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්):..........................................................................
..............................................................................................................................

1.4 සම්පූර්ණ නම : (ඉංග්‍රීසියෙන්) :.......................................................................
..............................................................................................................................

02. 2.1 තනතුර :.................................................................................................

2.2 එම තනතුරට පත් වූ දිනය : ..........................................................................

03 3.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (සිංහලෙන්) :.................................................
..............................................................................................................................

3.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්)......................................................
..............................................................................................................................

3.3 රාජකාරී ස්ථානය හා එහි ලිපිනය :...........................................................................

3.4 දුරකථන අංක : රාජකාරී : [ ] පුද්ගලික : [ ]

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.2 උපන් දිනය : [ ][ ][ ][ ] [ ][ ] [ ][ ]

4.3 ස්ත්‍රී පුරුෂ භාවය : [ ]

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

06. අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මෙම විභාගයට අදාළ සියලුම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය : අයදුම්කරුගේ/කාරියගේ අත්සන

---

07. කාර්යාල/අංශ ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා/නිලධාරිනිය මෙම කාර්යාලයේ/අංශයේ සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය: කාර්යාල/අංශ ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව